සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

40 S I

# පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023

## පෙරදිග සංගීතය - I

නම/විභාග අංකය : ..................................................................... කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

(1.) ස්වර සප්තකයට අයත් ප්‍රකෘති හා විකෘති ස්වර සංඛ්‍යාව කොපමණ ද?
(1) ප්‍රකෘති ස්වර 6යි. විකෘති ස්වර 6යි. (2) ප්‍රකෘති ස්වර 7යි. විකෘති ස්වර 5යි.
(3) ප්‍රකෘති ස්වර 5යි. විකෘති ස්වර 7යි. (4) ප්‍රකෘති ස්වර 8යි. විකෘති ස්වර 4යි.

(2.) සිතාරයේ සහ එස්රාජයේ ප්‍රධාන තත සුසර කරනු ලබන සම්මත ස්වරය වන්නේ
(1) සඩ්ජ ස්වරය යි. (2) මන්ද්‍ර සඩ්ජ ස්වරය යි.
(3) මධ්‍යම ස්වරය යි. යි. (4) මන්ද්‍ර මධ්‍යම ස්වරය යි.

(3.) නිර්දේශිත රාග අතුරෙන් මධ්‍යමය සහ නිශාදය වර්ජිතව යෙදෙන රාගය හා එය අයත් වන මේලය තෝරන්න
(1) යමන් රාගය - කළ්‍යාණ මේලය. (2) බිලාවල් රාගය - කළ්‍යාණ මේලය.
(3) භූපාලි රාගය - කළ්‍යාණ මේලය. (4) යමන් රාගය - බිලාවල් මේලය.

(4.) භෛරවී රාගයට අදාල **වන** කරුණ තෝරන්න
(1) කාෆි මේලයට අයත් වේ. (2) ගායන සමය රාත්‍රී ප්‍රථම ප්‍රහරය යි.
(3) ප්‍රකෘති විකෘති ස්වර දොළොසම වුව ද භාවිත කළ හැකිය. (4) ග ස්වරය වාදී ස්වරය යි.

(5.) සරි ගම ගරි ගප/මග මරි සරි ස- යන තානාලංකාරය
(1) බිලාවල් රාගයට අයත් වේ. (2) යමන් රාගයට අයත් වේ.
(3) කාෆි රාගයට අයත් වේ. (4) භූපාලි රාගයට අයත් වේ.

(6.) ගසරි, මරිග, පගම, වශයෙන් පිළිවෙලින් ගොඩනැගෙන ශුද්ධ ස්වර අභ්‍යාසයෙහි පස්වැනියට යෙදෙන ස්වර සමූහය වන්නේ,
(1) නිධනි, ස්වර සමූහය යි. (2) නිපධ, ස්වර සමූහය යි.
(3) නිසනි, ස්වර සමූහය යි. (4) රිනිස, ස්වර සමූහය යි.

(7.) ස,රි,ප යන ස්වර අනුවාදී ස්වර ලෙස යෙදෙන රාගය වනුයේ,
(1) භූපාලි රාගය යි. (2) කාෆි රාගය යි.
(3) යමන් රාගය යි. (4) බිලාවල් රාගය යි.

(8.) රාත්‍රී දෙවන ප්‍රහරයේ ගැයෙන රාගයකි,
(1) භෛරවී රාගය. (2) භූපාලි රාගය.
(3) යමන් රාගය යි. (4) කාෆි රාගය.

- පහත වගුවේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් අංක 9 සිට 12 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| න,<br>ත, තිං, | ගෙ, ග,<br>ගි, කි, | ධිං,<br>ධ, | X 0<br>2 3 |

(9.) තබ්ලාවේ දායාං සහ බායාං යන කොටස් දෙකම එකවර වාදනය කිරීමෙන් නිපදවා ගත හැකි අවනද්ධ අක්ෂර ඇතුලත් තීරුව වන්නේ,

(1) A තීරුව. (2) D තීරුව.

(3) C තීරුව. (4) B තීරුව.

(10.) තබ්ලාවේ දායාං කොටසින් පමණක් නිපදවා ගත හැකි අවනද්ධ අක්ෂර ඇතුලත් තීරුව වන්නේ,

(1) D තීරුව. (2) A තීරුව.

(3) C තීරුව. (4) B තීරුව.

(11.) තබ්ලාවේ බායාං කොටසින් පමණක් නිපදවා ගත හැකි අවනද්ධ අක්ෂර ඇතුලත් තීරුව වන්නේ,

(1) B තීරුව. (2) A තීරුව.

(3) C තීරුව. (4) D තීරුව.

(12.) ඉහත D තීරුවෙහි ඇති තාල සංඥා හතරම යොදා ප්‍රස්තාර කළ හැකි නිර්දේශිත තාල තුනක නම් ඇතුලත් පිළිතුර වන්නේ,

(1) දාදරා තාලය, ත්‍රිතාලය, කෙහෙර්වා තාලය. (2) දීප්චන්දි තාලය, ත්‍රිතාලය, කෙහෙර්වා තාලය.

(3) ඣප් තාලය, ත්‍රිතාලය, දාදරා තාලය. (4) දීප්චන්දි තාලය, ත්‍රිතාලය, ඣප් තාලය.

(13.) සුළු මැදුම් දෙතිතට අයත් බෙරපදයක් ලියා ඇති පිළිතුර තෝරන්න.

(1) දො ං/ජි ං ත/ග ත/දො ං ත/

(2) දො මි/කි ත/කි ත/දො මි/

(3) දො දො ං ත/ත කු දො ං

(4) දො ං ජි/ජි ග ත /

(14.) දීප්චන්දි තාලයට අනුව ගායනා කළ හැකි ගීතයක් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) " ලංකා ලංකා පෙම්බර ලංකා" යන ගීතය.

(2) "රන් මලක් ලෙස දෙව් බඹුන් දෝතින්"යන ගීතය.

(3) " සු නිල් වන් නුවන් යුග වසා" යන ගීතය.

(4) " ඕලු නෙළුම් නෙරිය රඟාලා" යන ගීතය.

(15.) පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය ට අනුව සර්පිනාව සහ තබ්ලා අයත් වන්නේ

(1) අවනද්ධ සහ සුෂිර වර්ග වලටය. (2) ඝන සහ අවනද්ධ වර්ග වලටය.

(3) සුෂිර සහ අවනද්ධ වර්ග වලටය. (4) තත් සහ අවනද්ධ වර්ග වලටය.

(16.) ''රෑ රැසේ අඳිනා ලෙසේ අත් ලෙලදිදී විදුලිය පබා'' මෙම ගී පාදයෙහි යෙදෙන සඳැස්මත් සහ ගීමත් ගණන දැක්වෙන පිළිතුර තොරන්න.

(1) සඳැස්මත් 26, ගීමත් 14 (2) සඳැස්මත් 28, ගීමත් 28

(3) සඳැස්මත් 24, ගීමත් 26 (4) සඳැස්මත් 26, ගීමත් 28

(17.) තාලයක් හා වෘත්තයක් පදනම්ව නිර්මාණය වූ වන්නම් විශේෂය වන්නේ,

(1) උඩරට වන්නම් (2) නෛයඩි වන්නම්

(3) සබරගමු වන්නම් (4) පහතරට වන්නම්

(18.) නාට්‍යයේ නම හා ඊට අදාළ ගීතය නිවැරදිව ඇතුළත් වරණය කුමක් ද?

(1) රතු හැට්ටකාරී - සෝබාව දේ
(2) තාරාවෝ ඉගිලෙති - අපි කිරිල්ලියෝ
(3) රතඳර සිරි පරදන - කුස පබාවතී
(4) අබුද්දස්ස කෝලම - පළමුව මම වැන්ද බුදුන්

- **පෙරදිග හා අපරදිග සංගීතයෙහි විශිෂ්ට සේවයක් සිදුකළ සංගීතඥයින් සිව්දෙනෙකු සම්බන්ධව විස්තර පහතින් දක්වා ඇත. එම තොරතුරු ආශ්‍රයෙන් අංක 19 සිට 22 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. **කෝරල් සහ එරොයිකා වැනි විශිෂ්ට සිම්ෆනි නිර්මාණය කර ඇත.**
B. **තබ්ලා වාදනය පිළිබඳ ප්‍රවීනත්වය සමගින් ලෝකයේම ජනප්‍රියත්වයට පත් වූ මෙතුමා සංගීත නිර්මාණ සඳහා ද දක්ෂතා දක්වා ඇත.**
C. **ඉතාලි ජාතික මෙම සංගීතඥයා Acropolis, Tribute ලෝකයේ ම ප්‍රසිද්ධ සමූහවාදන නිර්මාණ රාශියක් සිදු කර ඇත.**
D. **අති දක්ෂ ශාස්ත්‍රීය සිතාර් වාදන ශිල්පියකු වන මෙතුමා බටහිර සංගීතය සමඟ සිතාරය නිර්මාණාත්මක ව මුසු කරමින් ප්‍රසංග ඉදිරිපත් කර ඇත.**

(19.) ලුඩ්විග් වැන් බීතෝවන් සංගීතඥයා හා සම්බන්ධ වගන්තිය ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A අක්ෂරය. (2) B අක්ෂරය. (3) C අක්ෂරය. (4) D අක්ෂරය.

(20.) යානි සංගීතඥයා පිළිබඳ තොරතුරු ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A අක්ෂරය. (2) B අක්ෂරය. (3) C අක්ෂරය. (4) D අක්ෂරය.

(21.) ෂකීර් හුසේන් සංගීතඥයා පිළිබඳ තොරතුරු ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A අක්ෂරය. (2) B අක්ෂරය. (3) C අක්ෂරය. (4) D අක්ෂරය.

(22.) පණ්ඩිත් රවී ශංකර් සංගීතඥයා පිළිබඳ තොරතුරු ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A අක්ෂරය. (2) B අක්ෂරය. (3) C අක්ෂරය. (4) D අක්ෂරය.

(23.) සංගීත නිර්මාණයේ දී උතුරු ඉන්දීය සංගීතයේ ආභාසය ලබා ඇති රංග සම්ප්‍රදාය කුමක් ද?
(1) කෝලම් (2) නූර්ති (3) නාඩගම් (4) සොකරි

(24.) සොකරි රංග සම්ප්‍රදාය හා බැඳී ඇත්තේ,
(1) පහතරට ශාන්ති කර්මවල නාද රටාය (2) සබරගමු ශාන්ති කර්මවල නාද රටාය
(3) උඩරට ශාන්ති කර්මවල එන නාද රටාය (4) ජන සංගීතයේ එන නාද රටාය

(25.) මද්දලය හා හොරණෑව යොදා ගන්නා ලද රංග සම්ප්‍රදාය කුමක් ද?
(1) නූර්ති (2) සොකරි (3) නාඩගම් (4) කෝලම්

(26.) නාදයේ ත්‍රිවිධගුණ තාරතාවය, විපුලතාවය සහ ධ්වනිගුණය යන නම්වලින් විද්‍යාවේ දී හැඳින්වේ. ඒ සඳහා පෙරදිග සංගීතයේ හඳුන්වන ආකාරය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) උච්චනීච භේදය, ජාතිභේදය, රූප භේදය
(2) ජාතිභේදය , උච්චනීච භේදය, රූප භේදය
(3) රූප භේදය, ජාතිභේදය , උච්චනීච භේදය, ,
(4) උච්චනීච භේදය, රූප භේදය, ජාතිභේදය

(27) ''ස'' ස්වරයේ සංඛ්‍යාතය 256Hz නම් ''ග'' ස්වරයේ සහ ''ධ'' ස්වරයේ සංඛ්‍යාතයන් අනුපිළිවෙලින් සඳහන් පිළිතුර කුමක් ද?
(1) 288Hz - 480Hz (2) 320Hz - 340Hz (3) 340Hz - 426Hz (4) 320Hz - 426Hz

(28.) “සංගීත සම්භවය”, “විශ්ව සංගීත ක්ෂේත්‍ර” වැනි ග්‍රන්ථ රාශියක් නිර්මාණය කළ ශ්‍රී ලාංකීය සංගීතඥයා කව්රුන් ද?

(1) ලයනල් රංවල මහතා (2) රෝහණ බැද්දගේ මහතා

(3) ඩබ්.බී. මකුලොලුව මහතා (4) සී ද එස් කුලතිලක මහතා

(29.) ක්‍රි. ව. 1505 දී පමණ පෘතුගීසි පාලන සමයේ මෙරට ව්‍යාප්ත වූ සංගීතාංගය වන්නේ,


(1) කපිරිඤ්ඤා ගීත (2) කව්වාලි ගීත (3) පසන් ගීත (4) භජන් ගීත

(30.) චිත්‍රපට තේමා ගීතයකට වඩා සංධ්වනියක මෙන් වාද්‍ය සංගීත ලක්ෂණ ඇතුලත් ,සෝමදාස ඇල්විටිගල මහතා සංගීත අධ්‍යක්ෂණය කළ චිත්‍රපටය සහ තේමා ගීතය ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) රේඛාව - ඕලු නෙළුම් නෙරිය රඟාලා (2) සත් සමුදුර - සිනිඳු සුදු මුතු තලාවේ

(3) සැඩ සුළං - මා ප්‍රියාදර ජයභූමී (4) රේඛාව - සුදු සඳ එළියේ

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පහත ස්වර පුවරු රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**




(31) ස්වර පුවරු රූප සටහනේ 3, 8, 12 යතුරු එකවර වාදනය කිරීමෙන් ලැබෙන chord එක කුමක් ද?

(1) F Major (2) G Major (3) C Major (4) B Major

(32) F Major ස්කේලය සඳහා වාදනය කළයුතු යතුරු වලට හිමි අංක ඇතුළත් පිළිතුර වන්නේ .

(1) 1 3 5 6 8 10 12 13 (2) 3 5 7 8 10 12 14 15

(3) 1 3 5 7 8 10 12 13 (4) 3 5 7 8 10 12 13 15

(33) ස්වර පුවරු රූප සටහනේ 3, 6, 10 යතුරු එකවර වාදනය කිරීමෙන් ලැබෙන chord එක කුමක් ද?

(1) F Minor (2) G Major (3) G Minor (4) B Minor

(34) අංක 2 හා 11 ට හිමි ස්වර බටහිර සංගීතයේ දී නම්කළ හැකි ආකාරය දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) $D^{\#}$ , $C^{\#}$ (2) $F^{\#}$ , $E^{b}$ (3) $F^{\#}$ , $C^{\#}$ (4) $A^{\#}$ , $E^{b}$

(35) C Minor කෝඩ්ස් සඳහා වාදනය කළ යුතු යතුරු වලට හිමි අංක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) 1, 4, 8 (2) 5, 8, 12 (3) 1, 6, 8 (4) 8, 11, 15

- **පහත දැක්වෙනුයේ තත් වාද්‍ය භාණ්ඩ හතරක රූප සටහන් ය. ඒ ඇසුරෙන් අංක 35 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



A



B



C



D

(36) අළුවකින් (Bow) වයනු ලබන භාණ්ඩ යුගලයට අයත් ඉංග්‍රීසි අක්ෂර ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A සහ D ය. (1) B සහ D ය. (1) C සහ D ය. (1) A සහ B ය.

(37) ස්වර පිහිටීම සමාන වන සංගීත භාණ්ඩ යුගලයට අයත් ඉංග්‍රීසි අක්ෂර යුගලය වන්නේ,

(1) A සහ C ය. (1) A සහ D ය. (1) B සහ D ය. (1) A සහ B ය.

(38) ඉහත A, B, C, D, සංගීත භාණ්ඩවල ඇති ප්‍රධාන තත් ගණන සඳහන් පිළිතුර කුමකු ද?

(1) A - 5, B - 4, C -7, D - 4 (2) A - 4, B - 4, C -6, D - 5

(3) A - 4, B - 4, C -6, D - 7 (2) A - 4, B - 4, C -4, D - 7

(39) ඉහත C සහ D භාණ්ඩ යුගලය වාදනය සඳහා යොදාගන්නා උපකරණ පිළිවෙලින් සඳහන් පිළිතුර කුමක් ද?

(1) පික් (Pick) සහ මිස්රාබ් (2) මිස්රාබ් සහ පික් (Pick)

(1) අළුව (Bow) සහ මිස්රාබ් (2) අළුව (Bow) සහ පික් (Pick)

(40) පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණය සඳහා යොදාගන්නා මෘදුකාංගයක් වන්නේ

(1) Adobe InDesign (2) Adobe Illustrator (3) Cubase (4) Microsoft Office

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

40 S II

# පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023

## පෙරදිග සංගීතය - II

නම/විභාග අංකය : ......................................................................... කාලය : පැය 02යි.

පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමිවේ.

**(1.)**

i. රාගයක ආරෝහණයේ සහ අවරෝහණයේ ඇති ස්වර සංඛ්‍යාව අනුව තීරණය වන රාග ලක්ෂණය කුමක්ද?

ii. භෛරවී රාගය ගායනයේ දී හා වාදනයේ දී විවාදි ස්වර ලෙස යොදා ගතහැකි ස්වර ලියා දක්වන්න.

iii. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන වැයෙන තීව්‍ර මධ්‍යමය යෙදෙන රාගය කුමක්ද?

iv. ශුද්ධ ස්වර පමණක් යෙදෙන ඖඩව ජාතී රාගය කුමක්ද?

v. තාල වාද්‍ය භාණ්ඩ රාශියක හඬවල් ප්‍රතිනිර්මාණය කරගත හැකි ප්‍රසංග වේදිකාවේ භාවිතා වන විද්‍යුත් සංගීත භාණ්ඩයේ නම ලියන්න.

vi. දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයට අයත් වර්ග නම් කරන්න.

vii. ප්‍රභූ චරිත හාස්‍ය හා උපහාසයට ලක් කරමින් වර්ණවත් වෙස් මුහුණු පැළඳ රංගනයේ යෙදෙන පහතරට ජන නාට්‍ය ශෛලිය කුමක්ද?

viii. “I have a dream” යන ගීතය ගයන ලෝක ප්‍රකට ගායක කණ්ඩායම හඳුන්වන්න.

ix. පොතේගුරු හා අත්වැල් ගායක කණ්ඩායම වේදිකාවේ සිට ඉදිරිපත් කරන නාට්‍ය කලාව ............................ ... වන අතර , රඟ දක්වනු ලබන ස්ථානය.................................... නමින් හඳුන්වයි.

x. රේඛාව චිත්‍රපටයේ ගී තනු නිර්මාණය ................................... මහතා විසින් සිදු කරන ලද අතර සංගීත අධ්‍යක්ෂණය .................................... මහතා විසින් සිදු කරන ලදී.

**(2.)** නිර්දේශිත රාගවලට අයත් රාග විස්තර ඇසුරින් පහත වගුව සැකසී ඇත.


| | රාගය | මේලය (ථාඨය) | ආරෝහණ අවරෝහණ | වාදී සංවාදී | ගාන සමය | මුඛ්‍යාංගය |
|---|---|---|---|---|---|---|
| A | භූපාලි | කළ්‍යාණ | iii......................... ............................... | ග , ධ | vii............... | ගරිසධ සරිග පග ධප ගරිස |
| B | i............ | කාෆි | සරිගමපධනිස් ස්නිධපමගරිස | ප , ස් | රාත්‍රී දෙවන ප්‍රහරය | i x............... |
| C | බිලාවල් | බිලාවල් | සරිගමපධනිස් ස්නිධපමගරිස | v.......... | දිවා ප්‍රථම ප්‍රහරය | x............... |
| D | භෛරවී | භෛරවී | iv......................... ............................... | ම , ස | viii............... | මගු සරිස ධනිස |
| E | යමන් | ii.......... | සරිගම්පධනිස් ස්නිධපම්ගරිස | vi.......... | රාත්‍රී ප්‍රථම ප්‍රහරය | නිරි ගරිස පම් ගරිස |

i. ඉහත වගුවෙහි හිස්තැන් වලට ගැලපෙන පිළිතුරු අදාළ ප්‍රශ්ණ අංකය ද සමග ලියා දක්වන්න. (ලකුණු 05)

ii. **A ,C සහ E** යන රාග තුන අතුරින් කැමති එක් රාගයක් නම්කර, ඊට අයත් මධ්‍යලය ගීතයක / වාදිතයක **ස්ථායි කොටස,** නියමිත තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 05)

iii. **B සහ D** යන රාග දෙකෙන් කැමති එක් රාගයක් නම්කර , ඊට අදාළ මාත්‍රා 8 කට නොඅඩු වනසේ තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

**(3.)**




බායාං දායාං

(i) ඉහත තබ්ලාවේ රූප සටහනෙහි ඊතල වලින් දක්වා ඇති කොටස් නියමිත අක්ෂරය ද සමගින් ලියා දක්වන්න. (ලකුණු 02)


(ii) තබ්ලාවේ කොටස් දෙකෙහි මුහුණත් රූප සටහන් ඇඳ, නා , තිං ,ගෙ සහ ති යන අවනද්ධ අක්ෂර උත්පාදනය කරගන්නා ස්ථාන සළකුණු කරන්න. (ලකුණු 04)

(iii) මාත්‍රා 14 න් යුත් නිර්දේශිත හින්දුස්ථානී තාලය නම්කර, නියමිත තාල සංඥා සමගින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)


(iv.) කෙහෙර්වා තාලයේ මාත්‍රා කැටිවීමට සමාන දේශීය තිත නම්කර, ඊට අයත් බෙර පදයක් නියමිත තිත් සංඥා සමගින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

**(4.)**

(i) පහත දක්වා ඇත්තේ වයලීනයේ තත් සුසර කරන ආකාරයකි. එය පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන 2 සහ 3 තත් මත <u>රි ග ම ධ නි සං</u> යන ස්වර පිහිටා ඇති ස්ථාන ලකුණු කරන්න. (ලකුණු 03)




- පහත දක්වා ඇති ගිටාරයේ පර්දා පුවරුව(Fret Board) ඇසුරින් අසා ඇති ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.



(ii) ඉහත ගිටාරයේ 1 සහ 2 අංක වලින් දක්වා ඇති තත්, නම් කරන ආකාරය සහ 3 සහ 4 අංක වලින් දක්වා ඇති තත් සුසර කරන ස්වර ඊට අදාල අංකය ද සමග ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ඉහත කතිර සලකුණු කර ඇති ස්ථාන වල ඇඟිලි තැබීමෙන් වාදනය කළ හැකි කෝඩ් (Chord) එක නම් කරන්න. (ලකුණු 02)

(iv.) සිතාර් ,එස්රාජ් සහ බටනලා වාදනයෙහි ප්‍රසිද්ධියක් උසුලන එක් ඉන්දියානු සංගීත ශිල්පියෙකු බැගින් සංගීත භාණ්ඩයේ නම ද සමග ලියා දක්වන්න. (ලකුණු 03)

**(5.)**

(i) පහත දී ඇති ජනගී පාද, ගැමි ගී සහ සේ ගී වශයෙන් වෙන්කර ලියා දක්වන්න. (ලකුණු 04)


- රන් දැකැති ගෙන නිති සැරසෙනවා
- දුම්බර කන්ද පාමුල මිණිරන් පතලේ
- සේවිත පාද සරෝරුහ සන්ජිතයෙන් ඉතා
- අතට වෙරළු ඇහිදගෙනේ
- පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
- බුද්ධං සරණේ සිරස දරාගෙන
- වරමාතී සුහ චරිතේ
- කොහොව් යනා හඬ නගනා

(ii) ගැමි ගී සහ සේ ගී වල දැකිය හැකි විශේෂ ලක්ෂණ හතර බැඟින් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ඔබ කැමති වන්නමක හෝ හටන් ගීතයක මුල් කොටස ලියා දක්වන්න. (ලකුණු 02)

(iv.) “ ශාන්ත මේ රෑ යාමේ දී කුමුදු මලේ සිරියා ”යන ගී පාදයේ ඇතුළත් ලඝු, ගුරු, ප්ලුත අක්ෂර වෙන්කර ලියා දක්වන්න. (ලකුණු 03)

**(06.)** පහත දී ඇති අපරදිග ප්‍රස්තාර කොටස ඇසුරින් අසා ඇති ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.




(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ලියා දක්වන්න. (ලකුණු 04)

(ii) පෙරදිග ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන ලද ස්වර ප්‍රස්තාරය, මධ්‍යම භාවයට පෙරළා නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) ඉහත ස්වර ප්‍රස්තාරයේ 1, 2, 3, 4, වශයෙන් ලකුණු කර ඇති අපරදිග ස්වර සංකේත සඳහා භාවිත නාමයන් ලියා දක්වන්න. (ලකුණු 02)

(iv.) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය ලියා ඇති ස්කේලය නම් කරන්න. (ලකුණු 02)

**(07)** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

I. නාඩගම් රංග ශෛලියෙහි සංගීතමය ලක්ෂණ .

II. නූර්ති රංග ශෛලියෙහි සංගීතමය ලක්ෂණ .

III. ග්‍රැමෆෝන් ගී යුගයේ ජනප්‍රිය වූ ගීත සහ ගායක ගායිකාවන් .

IV. ඩබ්ලිව්.බී.මකුලොළුව ශූරීන්ගේ සංගීතමය සේවාව.

V. සංගීත ප්‍රසංගයක දී භාවිතාවන තාක්ෂණික මෙවලම් (ලකුණු 04 X 03 )